# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2297/30 – 2022 සැප්තැම්බර් 12 වැනි සඳුදා – 2022.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/159.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.12.30 දිනැති හා අංක 2208/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් 1. ගම්පල, මහරගම, නැදුන්ගමුව, සපුමල් උයන, 7 වන පටුමග, 162/27 හි පිහිටි කර්මාන්ත හා සේවා සේවක සංගමය (නිවැරදි ලිපිනය : ගම්පහ, මාහරගම, නැදුන්ගමුව, සපුමල් උයන, 7 වන පටුමග, අංක 162/27 හි පිහිටි කර්මාන්ත හා සේවා සේවක සංගමය) 2. බත්තරමුල්ල, ජයන්තිපුර, නෙළුම් මාවත, 1316 හි පිහිටි වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය සහ කොළඹ 02, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, අංක 130 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.07.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

1. කර්මාන්ත හා සේවා සේවක සංගමය
අංක 162/27, 7 වන පටුමග,
සපුමල් උයන, නැදුන්ගමුව,
මාහරගම,
ගම්පහ.

වානිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය,
අංක 1316,
නෙළුම් මාවත, ජයන්තිපුර,
බත්තරමුල්ල.

A/75/2020.
IR/COM/04/2018/159.

*පළමු පාර්ශවය*

සහ

2. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව,
අංක 130,
ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරාවුල

**පෙනී සිටීම**

පළමු පාර්ශවය වෙනුවෙන් — නීතිඥ ඒ. ඩී. දිශාන් ධර්මසේන

දෙවන පාර්ශවය වෙනුවෙන් — නීති නිලධාරිනි සුමේධා බස්නායක
රජයේ නීතිඥ කුමුදුමලී ගුණවර්ධන

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ :

''ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවකයන්ට හිමි වැටුප් තල, ශ්‍රේණි උසස්වීම්, විවිධ දීමනා ආදී හිමිකම් හා වරප්‍රසාද, ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙහි සේවය කරන, උපලේඛනයේ නම් සඳහන් සේවකයන්ට නොලැබීමෙන් එම සේවකයන්ට අසාධාරණයක් සිදු වී තිබේද? අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ''.

පළමු පාර්ශවය විසින් සිය ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශවය විසින් ඊට පිළිතුරු ප්‍රකාශ ගොනු කර ඇත. ඉන් අනතුරුව බේරුම්කරණ විභාග කටයුතු 2021.02.15 දින ආරම්භ කරන ලදී. පළමු පාර්ශවය විසින් එදින දෙවන ප්‍රකාශය ගොනු කරන ලදී. දෙවන පාර්ශවයේ දෙවැනි ප්‍රකාශය විභාග කටයුතු කෙරෙන අතරතුර ඉදිරිපත් කර ඇත.

පළමු පාර්ශවය සිය පළමු සහ දෙවැනි ප්‍රකාශවලින් බේරුම්කරණ අධිකරණයට ප්‍රකාශ කර සිටිනුයේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙහි සේවය කරන උපලේඛනයෙහි සඳහන් සේවකයින්ට ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවේ සේවකයන්ට හිමි වැටුප් තල, ශ්‍රේණි උසස්වීම්, විවිධ දීමනා සහ හිමිකම් සහ වරප්‍රසාද නොලැබීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බවත් එකී හිමිකම් හා වරප්‍රසාද සියල්ල 2006.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ලැබිය යුතු බවත්ය. තවද ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව එම ආයතනයේ සේවකයින්ට සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින්ට සාමානාත්මතාවයේ අයිතිය අනුව එක හා සමානව හිමිකම් ලැබීමට ඇති අයිතිය නොලැබීම නිසාද අසාධාරණයට ලක්ව ඇති බව කියා සිටී.

දෙවන පාර්ශවය සිය ප්‍රකාශයන්ගෙන් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථාව යටතේ පිහිටුවා ඇති රාජ්‍ය සංස්ථාවක් බවත්, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (නෙමෝ ආයතනය) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ පාලනය වූ ආයතනයක් බවත්, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් 2011.01.12 දිනැතිව ඉදිරිපත් කරන ලද අංක 2011/32 දරන කැබිනට් පත්‍රිකාවට අනුව එම වර්ෂයේදී එහි ඇති මානව සහ භෞතික වත්කම් සමඟ ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව යටතට පත් කර ඇති  බවත්ය.

දෙවන පාර්ශවය තව දුරටත් ප්‍රකාශ කර සිටින්නේ 2016.02.04 දිනැතිව නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවක් මගින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ වෙනම ව්‍යාපෘතියක් ලෙස වෙනම කළමනාකරණ කමිටුවක් යටතේ නැවත පිහිටුවන ලද බවයි. ඒ අනුව වෙනම ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් පළමු පාර්ශවකරුවන්ගේ මානව සම්පත්, වැටුප් සහ දීමනා සම්බන්ධ සියළු කටයුතු තීරණය කිරීමේ බලය ඇත්තේ ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට නොවන බවත්, ඒ පිළිබඳ සම්පූර්ණ හිමිකම සහ බලය ඇත්තේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට බවත් කියා සිටී. එසේම දෙවන පාර්ශවය තම දෙවන ප්‍රකාශයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පළමු පාර්ශවයේ සේවා යෝජක නොවන බවත් එබැවින් පළමු පාර්ශවයේ පළමු ප්‍රකාශය දුෂ්බන්ධනය හෝ අවබන්ධනය වී ඇති බවත්, මෙම නඩුවේ උපලේඛණයේ නම් සඳහන් සේවකයින් පළමු පාර්ශවයේ සේවකයන්ද යන්න නොදන්නා බවත් තවදුරටත් ප්‍රකාශ කර සිටී. තවද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මෙම සේවකයින්ගේ සේවා යෝජක ලෙස මෙම නඩුවට වග උත්තර පාර්ශවයන් ලෙස නම් කර නොමැති බවත්, එබැවින් අයැද ඇති සහනයන් දෙවැනි පාර්ශවයෙන් ඉල්ලීමට පළමු පාර්ශවයට නෛතික බලයක් නොමැති බවද ප්‍රකාශ කර  සිටී.

ඉහත පාර්ශවයන් අතර පවතින කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ පිළිබඳ බේරුම්කරණයක් සිදුකිරීම සඳහා පහත සඳහන් ගැටළු විසඳා ගත යුතු වේ :

(I) ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙහි සේවය කරන සේවකයින්ගේ සේවායෝජක වන්නේ ද?

(II) ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවකයින්ට හිමි වැටුප් තල, ශ්‍රේණි උසස් වීම්, විවිධ දීමනා ආදී හිමිකම් සහ වරප්‍රසාද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින්ට හිමි වන්නේ ද?

(III) ඉහත සඳහන් හිමිකම් සහ වරප්‍රසාද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින්ට ලැබී නොමැති ද?

(IV) එසේ නොලැබීමෙන් පළමු පාර්ශවයට අසාධාරණයක් සිදු වී තිබේද ?

(V) එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද? කිනම් පුද්ගලයින් හටද? කවර දින හෝ කාලසීමාවක් සඳහා ද?

මෙම  බේරුම්කරණ නඩුවෙහි පළමු පාර්ශවයට තමන්ට නොලැබී ඇතැයි සඳහන් කරනු ලබන හිමිකම් සහ වරප්‍රසාද ඉල්ලා සිටිනුයේ දෙවැනි පාර්ශවය වන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතිනි. පළමු පාර්ශවය වනුයේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ කාර්මික ආරවුලට අදාල ලේඛණයේ සඳහන් සේවකයින් 239 දෙනා සහ කාර්මික ආරවුල් පනතේ 27 වන වගන්තිය යටතේ පසුව එක් කරන ලද සේවකයින් 35 දෙනාද ඇතුලත්ව සේවකින් 274 දෙනෙකි. මෙහිදී විසඳා ගත යුතු ගැටළුව වන්නේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින්ගේ සේවා යෝජකවන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවද යන්නයි.

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 1992 දී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් රජයේ අරමුදල් යොදවා රජය සතු ව්‍යාපෘතියක් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ පිහිටුවන ලදී. පසුව 2011.01.12 දිනැති අංක අමප/11/0089/517/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සහ 2011.01.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සියළු වත්කම්, වගකීම් සහ මානව සම්පත ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධ කිරීමට කටයුතු කර ඇත. පසුව 2016.01.13 දිනැති සහ අංක 16/0082/736/002 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පරිදි 2016.01.27 දිනැතිව ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය නැවතත් වෙන් වූ ස්වාධීන කළමනාකරණ කමිටුවක් යටතේ පාලනය වන ආයතනයක් ලෙස ප්‍රතිසංවිධානය කර ඇත. මේ අනුව 1992 සිට 2011 දක්වා කාලය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ වෙනම අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය වූ ආයතනයක් ලෙසත්, 2011 සිට 2016 දක්වා කාලය ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධ ක්‍රියාත්මක වූ ආයතනයක් ලෙසත්, 2016 න් පසුව නැවතත් ස්වාධීන කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වන ආයතනයක් ලෙසත් ක්‍රියාත්මක වී ඇත. මේ අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින්ගේ සේවා  යෝජකයා එක් එක් කාල වලදී වෙනස් වී ඇති බව පෙනේ.

පළමු පාර්ශවය තම සාක්ෂි ඉදිරිපත් කරමින් කියා සිටිනුයේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සේවකයින්ගේ නොලැබී ඇතැයි සඳහන් කරනු ලබන හිමිකම් සහ වරප්‍රසාද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව 2006 වසරේ සිට ලබා දිය යුතු බවයි. NEMO ආයතනයේ සියළුම මානව හා නෛතික සම්පත් මෙන්ම සියළු වගකීම් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාර ගැනීමට යටත්ව ඒකාබද්ධ කර ඇති බැවින් දෙවැනි පාර්ශවය ඒ පිළිබඳව හබ නොකරයි.

දෙවෙනි පාර්ශවය තම සාක්ෂි මගින් තහවුරු කරනුයේ 2011-2016 දක්වා කාලය තුළ පමණක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයන්ගේ සේවායෝජකයා ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව බවයි. එම කාලය තුළ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයන්ගේ සියළුම පත්වීම්, උසස්වීම්, වැටුප් ගෙවීම් ඇතුළු සියලු කටයුතු ජාතික ඉංජිනේරු සංස්ථාව මගින් සිදුකළ බව කියා සිටී.

2016 දී ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, ජාතික යන්ත්‍රෝපකරණ හා උපකරණ සංවිධානය ලෙස ප්‍රතිසංවිධානය කිරීමේදී වෙනම කළමනාකරණ කමිටුවක් යටතේ වෙනම ව්‍යාපෘතියක් ලෙස පිළිගැනීම සහ ස්ථාපිත කිරීම නිසා ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සේවකයන්ගේ සේවායෝජකයා තව දුරටත් ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව නොවන බවට දෙවැනි හරස් ප්‍රශ්නවලදී සහ තම සාක්ෂිය ඉදිරිපත් කිරීමේදී කරුණු ඉදිරිපත් කරයි.

පළමු පාර්ශවය විසින් තම සේවකයින්ගේ සේවායෝජකයා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව බව තහවුරු කිරීමට ඉදිරිපත් කර ඇති A1 ලේඛනයෙහි 02 ඡේදයෙහි " විශ්‍රාම ගන්වන අවස්ථාව වනතෙක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමග සේවා ගිවිසුමකින් බැඳී සිටි බව තහවුරු වේ." ලෙස ලේඛනය සාක්ෂි මගින් තහවුරු වන බව දක්වයි. එහෙත් එම ලේඛනය සාක්ෂි මොනවාදැයි දක්වා නොමැති අතර, මෙම බේරුම්කරණ විභාගයටද ඉදිරිපත් නොකරයි. තවද එහි සඳහන් ප්‍රශ්නගත සේවකයින් 113 කවරෙකුදැයි දක්වා නොමැති අතර, එම අය බේරුම්කරණයෙහි පාර්ශවකරුවන් වන්නේද යන්න ද දක්වා නොමැත.

තවද, පළමු පාර්ශවය A3 ලෙස ඉදිරිපත් කරන කම්කරු විනිශ්චය අධිකරණ නඩු අංක 02/අති/3773/2017 දරන නඩුවේදී වග උත්තරකරුවන් දෙදෙනෙකි. එනම් ; (01) ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ( ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ) තේමා උද්‍යාන ගොඩනැගිල්ල, මීගමු පාර, පැලියගොඩ සහ (02) ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන අයයි. එහි නඩු නියෝගය ලබාදී ඇත්තේ සේවායෝජක ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ( ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ) ට වේ.

තවද, පළමු පාර්ශවය විසින් A4 ලෙස ඉදිරිපත් කර ඇති කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 30 හි 01 ඡේදයේ දැක්වෙන පරිදි වැටුප් සංශෝධනය සහ සේවක මණ්ඩලය නැවත කාණ්ඩගත කිරීම කළයුතු ආයතන ඇමුණුම iii ලේඛනයෙහි දක්වා ඇත. එහි අංක 67 යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව දක්වා ඇත. එහෙත් මෙම වැටුප් සංශෝධනය අදාළ වන ඇමුණුම iii හි දක්වා නොමැති ආයතනයක් තිබේ නම් ඒ පිළිබඳව " ඉහත වැටුප් සංශෝධනය අදාළ වන නමුත් ඇමුණුම් iii ට ඇතුලත් නොවූ කිසියම් ආයතනයක් වේ නම්, එම ආයතනය සිය වැටුප් සංශෝධනය පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විමසිය යුතුය" යනුවෙන් ප්‍රතිපාදන සලසා ඇත.

තවද, පළමු පාර්ශවය විසින් A8 ලෙස ඉදිරිපත් කර ඇති අභියාචනාධිකරණය රිට් ඉල්ලුම්පත්‍ර අංක 742/2005ට අදාළ නියෝගය මගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය අතර පවතින සේවක සේවායෝජක සම්බන්ධතාව පැහැදිලි කර ඇත. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ මාරඹගේ සුනිල් සිල්වා යන අය රා. පරි. චක්‍ර ලේඛ අංක 9/2004 සහ කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 2004/25 හි වැටුප් වැඩිවීම් ක්‍රියාත්මක කරවා ගැනීමට මැන්ඩාමුස් ආඥාවක් ඉල්ලා සිටී. අමාත්‍ය මණ්ඩල තීරණයකින් පිහිටුවා ඇති බැවින් සහ එහි පරිපාලනය, කළමනාකරණය සහ පාලනය තමන්ගේම කළමනාකරණ මණ්ඩලයක් මගින් සිදුකර ගනු ලබන බැවින් එය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කොටසක් ලෙස පිළිගැනීමට පදනමක් නොමැති බව නියෝගයෙහි දක්වා ඇත. ඒ අනුව ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කරනු ලබයි. 2016න් පසු තත්ත්වය සළකා බලන විට ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සම්බන්ධයෙන්ද එම විග්‍රහය එපරිදිම අදාල කරගත හැකිය. මෙම බේරුම්කරණය සම්බන්ධයෙන් විසඳිය යුතු ඊළඟ ප්‍රශ්නය වන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවකයින්ට හිමි වැටුප් තල, ශ්‍රේණි උසස්වීම්, විවිධ දීමනා ආදී හිමිකම් සහ වරප්‍රසාද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයන්ට හිමි වන්නේද යන්නයි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පාර්ලිමේන්තු පනතකින් පිහිටුවා ඇති අතර, එහි ව්‍යවස්ථාපිත කාර්යභාරයක් දක්වා ඇත. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය අමාත්‍ය මණ්ඩල තීරණයකින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සැපයීමට පිහිටුවන ලද ආයතනයක් වේ. 2011 වසරේදී මෙම ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධ කළද එහි නිශ්චිත කාර්යය ඉටු කිරීම සඳහා සංස්ථාව තුළ ''උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර අංශය'' නමින් වෙනම අංශයක් ලෙස ක්‍රියාත්මක වී ඇත.

ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සියලු සේවකයින්ගේ වැටුප් පරිවර්තනය කර අදාල වැටුප් තලවල පිහිටුවන ලද බව සාක්ෂිවලින් පැහැදිලි වේ. එසේම නියමිත උසස්වීම් ලබාදී ඇති බවටද සාක්ෂි ඉදිරිපත් වී ඇත. විවිධ දීමනා සහ අනෙකුත් වරප්‍රසාද හිමිවනුයේ එක් එක් සේවා ඝනයන්ට තමා ඉටු කරනු ලබන රාජකාරී ස්වභාවය අනුවය. එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන අතර, අංශ අතර මාරු වීමේදී එකී දීමනා හිමි වීම් හෝ අහිමි වීමට අවස්ථාව ඇත. පළමු පාර්ශවය විසින් A7 යටතේ ඊට අදාල චක්‍රලේඛ ඉදිරිපත් කර ඇත. විභාගයේදී ඉදිරිපත් වූ පුද්ගල සාක්ෂි සහ ලේඛනමය සාක්ෂි අනුව වැටුප් තල, උසස්වීම්, සහ දීමනා ලබාදී ඇති බව සනාථ වේ. උසස්වීම් සහ දීමනා නොලැබුනා යැයි සඳහන් කළ සාක්ෂිකරුවන් ඒ පිළිබඳව නිශ්චිත කරුණු දැක්වීමට අපොහොසත් වී ඇත.

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධව පැවති කාලය තුළ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය එහි වෙනම අංශයක් ලෙස ක්‍රියාත්මක වුවද ඉහත චක්‍රලේඛ ප්‍රකාර යම් යම් දීමනා ලබාදී ඇති බව පළමු පාර්ශවයේ සහ දෙවනි පාර්ශවයේ සාක්ෂි වලින් සනාථ වේ.

2006 කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව ඒ ඒ සේවකයින්ට හිමි වැටුප් තල සහ ශ්‍රේණි උසස්වීම් එම සේවකයින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමේදීම ලබාදී ඇති බව පත්වීම් ලිපි සහ වැටුප් පරිවර්තන ලිපිවලින් සනාථ වේ. එහෙත් 2011 වන විට එතෙක් හිඟ වැටුපක් තිබිණි නම් එය නොගෙවන බවද දක්වා ඇත. එම පත්වීම් ලිපිවල කොන්දේසිවලට යටත්ව එකඟතාවය ප්‍රකාශ කරමින් පත්වීම් ලිපි ලබාගෙන ඇත. කෙසේ නමුත් හිඟ වැටුප් සම්බන්ධව ඉල්ලීම් ඉදිරිපත් කළ බවක් හෝ ඉහළ කළමනාකරණය සමඟ සාකච්ඡා කළ බවක් හෝ බේරුම්කරණයට ඉදිරිපත් කරන තෙක් ඒ පිළිබඳ වෙනත් ක්‍රියාමාර්ගයක් ගත් බවක් හෝ තහවුරු කිරීමට පළමු පාර්ශවය අපොහොසත් වී ඇත.

තවද, සේවකයින් 274 දෙනෙකු සම්බන්ධයෙන් පළමු පාර්ශවය දිවුරුම් ප්‍රකාශ ගොනු කර ඇති අතර, එමගින් එක් එක් සේවකයන්ට අහිමි වූ මුදල් ප්‍රමාණයන් දක්වා ඇත. එහෙත් මෙම දීමනා ඒ ඒ අයට හිමි බවට හෝ අහිමි වූ දීමනාවන් මොනවාද යන්න හෝ එකී දීමනා කිනම් කාලසීමාවකට අයත් වේද යන්න හෝ නිශ්චිතව දක්වා නොමැත. එමෙන්ම එම වටිනාකම් ගණනය කළ ආකාරයද පැහැදිලිව දක්වා නොමැත. අයැද සිටින සහනය හිමි බවට නිශ්චිතව සනාථ කර නොමැති විටෙක හෝ එය අදාල වනුයේ කිනම් කාලයකටද යන්න නිශ්චිතව දක්වා නොමැති විටක හෝ එවැනි සහනයක් ලබා දීමට බේරුම්කරණයට හැකියාවක් නොමැත. ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පළමු පාර්ශවයේ සේවකයින් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධ කිරීමෙන් පසුව අදාල වැටුප පරිවර්තනය සිදුකොට නියමිත වැටුප් තල සහ ශ්‍රේණිවල පිහිටුවා ඇති අතර, හිමිකම් ලබන යම් යම් දීමනා ලබාදී ඇති බවද, අසමානව සළකා ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී නොමැති බැවින්ද ඔවුනට අසාධාරණයක් සිදුවී නොමැති බවට නිගමනය කරමි.

**නිගමනය**

මෙම බේරුම්කරණ විභාගය 2021.02.15 දින ආරම්භ කර 2022.03.15 දින අවසන් කර ඇත. එම කාල සීමාව තුළ දින 08 ක දී රැස්වී පළමු සහ දෙවන පාර්ශවයේ සාක්ෂි විමසා ඇත. පළමු පාර්ශවය මගින් පුද්ගල සාක්ෂි 04ක්ද, ලිඛිත සාක්ෂි A1 සිට A29 දක්වාද, දෙවන පාර්ශවය විසින් පුද්ගල සාක්ෂි 01 ක්ද, ලිඛිත සාක්ෂි R1 සිට R26 දක්වාද ඉදිරිපත් කර ඇත.

කම්කරු කොමසාරිස්වරයා විසින් බේරුම්කරණයට ඉදිරිපත් කරන ලද යොමුව අනුව මෙහිදී විසඳා ගතයුතු මූලික ප්‍රශ්ණය වූයේ පළමු පාර්ශවයේ සේවා යෝජක දෙවනි පාර්ශවය වන්නේද යන්නයි. විධායකය ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අවස්ථා 3 කදී ගනු ලැබූ තීරණ අනුව පළමු පාර්ශවය දෙවන පාර්ශවයේ සේවා යෝජක වන්නේ 2011-2016 දක්වා පමණි. කාර්මික ආරාවුල බේරුම්කරණයට ඉදිරිපත් වන අවස්ථාවේදී එනම් තත් කාලයේදී ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පළමු පාර්ශවයේ සේවායෝජක නොවන බව නිගමනය කරමි. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පළමු පාර්ශවයේ සේවායෝජක ලෙස කටයුතු කළ 2011-2016 කාල සීමාවේදී පළමු පාර්ශවයේ සේවකයින්ට හිමි විය යුතු වැටුප් තල ශ්‍රේණි උසස්වීම්, විවිධ දීමනා ආදී හිමිකම් හා වරප්‍රසාද ලබාදී ඇති බවද, එබැවින් උපලේඛණයේ නම් සඳහන් සේවකයින්ට අසාධාරණයක් සිදුවී නොමැති බවද තීරණය කරමි.

බේරුම්කරු.

2022 ජූලි මස 25 වැනි දින.

EOG 09-0117

---

මගේ අංකය: IR/COM/01/2018/221.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.11.09 දිනැති හා අංක. 2148/58 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් සෙවනගල, සෙවනගල හන්දිය, අංක. 61, මලිත් ස්ටාර් හවුස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් හි පදිංචි ඊ. ජීවගන් මයා සහ සෙවනගල පිහිටි ලංකා සීනි (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.08.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණයේ දී ය

IR/COM/01/2018/221.

ඊ. ජීවගන් මයා,
මලිත් ස්ටාර් හවුස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්,
අංක. 61,
සෙවනගල හන්දිය,
සෙවනගල.

නඩු අංක: A/113/2019.

*සහ*

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම
සෙවනගල.

*අතර*

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත කී ඉල්ලුම්කාර පාර්ශවය හා වගඋත්තරකාර පාර්ශවය අතර පවත්නා ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.11.04 දිනැති නියෝගයෙන් මා පත්කර මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

“ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කළ ඊ. ජීවගන් මහතාට උසස්වීම් ලබා නොදීමෙන් හා එස් 3 ශ්‍රේණියේ වැටුප සඳහන්කොට එස් 4 ශ්‍රේණියේ වැටුප ලබා දීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

මෙම නඩුව විභාගයට ගත් අවස්ථාවේ දී පළමුවන පාර්ශවය පැමිණ සිටි අතර ඔහු වෙනුවෙන් නීතිඥ මහේන්ද්‍ර ඩයස් මහතාගේ උපදෙස් මත නීතිඥ රොහාන් ජයලත් මහතා පෙනී සිටින ලදී. දෙවන වගඋත්තරකාර පාර්ශවය වන සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම වෙනුවෙන් විමර්ශන නිලධාරී ආර්. එම්. ඩී. එල්. හේමපාල මහතා නියෝජනය කළ අතර ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් වී. ටී. ජී. ප්‍රසන්න මහතා පෙනී සිටින ලදී. පළවන පාර්ශවය වෙනුවෙන් ලිඛිත දේශන ගොනු කර නැති අතර, දෙවන පාර්ශවය වෙනුවෙන් ලිඛිත දේශන හා ලේඛන ඉදිරිපත් කර ඇත.

පළමුවන පාර්ශවය 1981 වසරේ සිට වගඋත්තරකරුගේ පූර්වගාමී ආයතනවල සේවය කර 2011.11.11 වන දින සිට වගඋත්තරකාර දෙවන පාර්ශවය යටතේ කාර්මික තනතුරේ 2019.02.23 වන දින විශ්‍රාම ගන්නා තෙක් සේවය කර ඇති බව පාර්ශවයන් අතර විවාදයට ලක්ව නැත. මෙහිලා විසඳිය යුතුව ඇති මූලික කරුණ වී ඇත්තේ පළමු පාර්ශවය සේවය කර ඇත්තේ එස් 4 ශ්‍රේණියේ ද? එසේ නොවන්නේ නම් එස් 3 ශ්‍රේණියේ ද? යන්න හා එස් 3 ශ්‍රේණියේ සේවය කර ඇත්තේ නම් ඒ අනුව ඔහුට හිමි නියමිත වැටුප් ප්‍රමාණය අනුව ලැබිය යුතු සහන කවරේ ද? යන්නයි.

පළමුවන පාර්ශවය වන ඊ. ජීවගන් සිය මූලික සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මගින් හා වාචිකව ද දක්වා ඇති අතර, ඔහුගේ ස්ථාවරය වී ඇත්තේ 2013.01.03 දිනැති ආර් 02 හා පැ 1 ලෙස ඉදිරිපත් කර ඇති ලිපිය පරිදි 19091-12x400-23891 වැටුප් පරිමාණය ලෙස දක්වා තිබියදී එහි එස් 4 ලෙස වැරදි ලෙස සටහන්ව ඇති බවත්, එසේ වුවද තමා වෙත 2019 වසරේ විශ්‍රාම යන තෙක් වැටුප් ගෙවා ඇත්තේ 2013.02.14 දිනැති ආර් 3 ලිපිය මගින් 18557-12x300-22157 වැටුප් පරිමාණය යටතේ වීම හේතුවෙන් මාසිකව රු. 100 ක අලාභයක් වී ඇති බවත්, ඒ අනුව අතිකාල හා සේවක අර්ථසාධක වෙනුවෙන් දායක මුදල් ගණනය කිරීමේ දී විශාල ආර්ථික අලාභයක් සිදුවී ඇති බවත්ය.

සෙවනගල ෂුගර් ඉන්ඩස්ට්‍රීස් ලෙස දයා ගෲප් යටතේ පෞද්ගලික පාලනයකට යටත්ව තිබී 2011.11.11 දින සිට එකී ආයතනය රජයට පවරාගෙන ආර් 5 පරිදි ලංකා ෂුගර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් (සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම) ලෙස 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති බව දෙපාර්ශවය පිළිගනී. 2012.08.24 දිනැති ආර් 1 ලිපිය පරිදි වගඋත්තර ආයතනය බිහිවූ

පසු ඊ. ජීවගන් එස් 5 ශ්‍රේණියට අදාළව 18211-12x200-20611/- වැටුප් පරිමාණයේ පිහිටුවා 2013.01.13 දිනැති ආර් 2 ලිපිය පරිදි එස් 4 ශ්‍රේණියට උසස් කිරීමේදී එකී ලිපියේ අත් වැරදීමකින් එස් 4 ශ්‍රේණියට ඉහළ ශ්‍රේණියක් වූ එස් 3 ශ්‍රේණියේ වැටුප් පරිමාණය වන 19091-12x400-23891 වැටුප් පරිමාණයේ සටහන් වී ඇති බවත් එය කළමණාකාරිත්වය විසින් ඔහුට පහදා දුන් පසු ඔහු එය පිළිගත් බවත්, දෙවන පාර්ශවයේ ස්ථාවරය වී ඇත. එකී ලිපියේ ශ්‍රේණිය එස් 4 ලෙස පැහැදිළිව සටහන්ව තිබීමත්, ආර් 2 ලිපිය පරිදි ඔහු එස් 5 ශ්‍රේණියේ සිට එස් 4 ශ්‍රේණියට උසස්ව තිබීමත්, මත එහිදී අත්වැරදීමකින් එස් 4 ලෙස සඳහන් කර එස් 3 ශ්‍රේණියේ වැටුප සටහන් වී ඇති බවට දෙවන පාර්ශවය ගත් ස්ථාවරය නිවැරදි වේ. ඒ අනුව ආර් 3 ලිපිය මගින් එස් 4 ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණය පරිදි 2013.01.01 දින සිට 18557-12x300-22157 වැටුප් පරිමාණයේ ඔහු නිවැරදිව පිහිටුවා ඇති බවත්, ඒ අනුව ඔහුට හිමි වැටුප් වර්ධකය රු. 400/- නොව රු. 300/- වන හෙයින් රු. 100/- ක අලාභයක් ඔහුට මාසිකව සිදුවී නොමැති බවට මම නිගමනය කරමි.

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම රජය සතු ආයතනයක් ලෙස ලියාපදිංචි කල පසු 2013 වසරේ උසස්වීම් ලද පසු සියලුම සේවකයන්ට උසස්වීම් ලබා දුන්නේ 2019 වසරේ බවත්, ඒ වන විට තමා විශ්‍රාම ගොස් තිබූ බවද ජීවගන් හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පිළිගෙන තිබීම මත ඔහුට උසස්වීම නොදී වෙනස්කම් කළ බවට ඔහු පවසන කරුණ ද පිළිගත නොහැකිය. පැ 1 ලෙස වාචික සාක්ෂියේ දක්වා ඇති ටී 7/10/2001 දරන ලේඛනයේ අංක 7 යටතේ දැක්වෙන පරිදි තම ප්‍රශ්නය නොවිසඳු බවට දක්වා ඇතත්, එය 2002.05.15 වන දින පූර්වගාමී ආයතනය යටතේ ඇතිවූ එකගත්වයක් ලෙසටත්, එකී පූර්වගාමී ආයතනයේ අදාළ කාලයේ ලිපිගොනු කිසිවක් හෝ මෙම වගඋත්තරකාර පාර්ශවයට ලබා දී නොමැති බවත්, එකී ලිපි සපයන ලෙස ජීවගන්ට කියා සිටිය ද වගඋත්තරකරු වෙත ඒවා ලබා දී නොමැති බවත්, වගඋත්තරකරුගේ ස්ථාවරය වී ඇත.

මෙහෙයවා ඇති සියලු සාක්ෂි හා ලේඛන සමස්ථයක් ලෙස සැළකීමේදී ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කළ ඊ. ජීවගන් මහතාට උසස්වීම් ලබා නොදීමෙන් හා එස් 3 ශ්‍රේණියේ වැටුප සඳහන් කොට එස් 4 ශ්‍රේණියේ වැටුප ලබා දීමෙන් අසාධාරණයක් සිදු වී නොමැති හෙයින් ඔහුට හිමි විය යුතු කිසිදු සහනයක් නොමැති බවට මම නිගමනය කරමි. ඒ අනුව පළමු පාර්ශවය වන ජීවගන් මහතා විසින් නිරවුල් කිරීමේ සහතිකය දෙවන පාර්ශවය වෙත ඉදිරිපත් කළ පසුව ඔහු වෙත ගෙවිය යුතු අවසන් මස වැටුප, දිරි දීමනා හා ලාභාංශ දීමනා වෙතොත්, ඒවා ලබා ගැනීමේ අයිතියට යටත්ව මෙම ඉල්ලුම් පත්‍රය නිශ්ප්‍රභා කරමින් නියෝගය නිකුත් කරමි.

කේ. ඒ. පියරත්න,
බේරුම්කරු.

2022 ක් වූ අගෝස්තු මස 15 වන දින,
කොළඹ දී ය.

EOG 09 – 0118